කොවිඩ් 19 - සති පාසල

2021 - ii වාරය - පස්වන සතිය

10 ශ්‍රේණිය | භූගෝල විද්‍යාව

## 4 - ශ්‍රී ලංකාවේ කෘෂිකර්මාන්තය

පොල්, රබර් හා සුළු අපනයන භෝග (පෙළ පොත පිටු ංක 58 - 68)

- පොල් ගස ශ්‍රී ලංකාවේ ජන ජීවිතය හා බැඳුනු සුවිශේෂී ශාකයකි. පොල් ගසෙහි සෑම කොටසක්ම පාහේ ප්‍රයෝජනයට ගැනීම නිසා කප්රුක යන නමින්ද හඳුන්වයි. මහපොල් ත්‍රිකෝණය, සුළු පොල් ත්‍රිකෝණය ආදී ලෙස විශේෂිත ප්‍රදේශවලද සමස්තයක් ලෙස මුළු රටෙහිමද ගෙවතු වගාවක් ලෙස ද පොල් වගා කෙරේ. වර්තමානය වන විට මෙරට පොල් නිෂ්පාදනයෙන් වැඩි කොටසක් දේශීය පරිභෝජනයටම යොදා ගනී.
- බ්‍රිතාන්‍ය ජාතික හෙන්රි වික්හැම් විසින් ගම්පහ හෙනරත්ගොඩ උද්‍යානයේ මුල්ම රබර් පැළය රෝපණය කර ඇත. වර්තමානයේ රබර් වගාව මෙරට වතු කෘෂිකර්මාන්තයේ ප්‍රධාන වගාවක් බවට පත්ව තිබේ. එය ශ්‍රී ලාංකිකයිනට රැකියා සැපයීමේ මාර්ගයක් පමණක් නොව අපනයන ආදායම් ඉපැයීමේ මාර්ගයක්ද වේ. දේශීය කර්මාන්තකරුවන් විසින් අමුද්‍රව්‍යයක් ලෙස රබර් භාවිත කරමින් වෙළඳපොළට විවිධ නිෂ්පාදන ඉදිරිපත් කිරීමද වර්තමානයේ සුවිශේෂී වේ.
- සාම්ප්‍රදායික අපනයනවලට අමතරව අපනයනය සඳහා කුඩා පරිමාණයෙන් වගාකරන කෘෂිකාර්මික භෝග, සුළු අපනයන භෝග නම් වේ. අතීතයේ ශ්‍රී ලංකාවේ එළවළු වගාව සම්බන්ධයෙන් විශේෂිත කලාප හඳුනාගෙන තිබුනද වර්තමානයේ දියුණු තාක්ෂණය උපයෝගී කරගෙන බොහෝ ප්‍රදේශවල එළවළු වගාකරනු ලැබේ. ශ්‍රී ලංකාවේ පලතුරු සඳහාද දේශීය මෙන්ම විදේශීය වෙළඳපොළක් පවති.

**ක්‍රියාකාරකම**

01. පොල් ගස දේශීය ජන සමාජයේ කප්රුක ලෙස හැඳින්වීමට හේතු උදා- සහිතව පැහැදිලි කරන්න.

02. රබර් වගාව වැඩි දියුණු කිරීම ශ්‍රී ලංකාවේ ආර්ථිකයට මහත් සවියකි. මෙම කියමන පැහැදිලි කරන්න.

03. ශ්‍රී ලංකාවේ රබර් නිෂ්පාදන අපනයනය කරන රටවල් පහක් ලියන්න.

04. පහත වගුව සම්පූර්ණ කරන්න.

| භෝගය | පර්යේෂණ ආයතන | ව්‍යාප්තියට අවශ්‍ය භෞතික සාධක | අවශ්‍ය වෙනත් සාධක | වගාකරන ප්‍රදේශ |
|---|---|---|---|---|
| පොල් | | | | |
| රබර් | | | | |
| | | | | |

05. මෙරට තුල සුළු අපනයන භෝග කෙරෙහි විශේෂ අවධානයක් යොමු කිරීමට හේතු මොනවාද ?

06. ශ්‍රී ලංකාවේ එළවළු හා පලතුරු වගාවන් වැඩි දියුණු කිරීමෙන් ලබා ගත හැකි ප්‍රයෝජන තුනක් ලියා ඒවා වැඩි දියුණු කිරීමට කළ හැකි නව යෝජනා තුනක් ලියන්න.